**ජාතික ක්‍රීඩා අරමුදල - 2019**

**------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

ජාතික ක්‍රීඩා අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධනය ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25 (4) වගන්තිය සමග සංයෝජිත කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ජාතික ක්‍රීඩා අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙසසැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

-------------------------------------------

| ගිණුම් විෂය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ---------------------- | ------------ | ----------------------- | --------------------- | ---------------------- |
| | රු. | | | |
| ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රකාශනයක් ලෙස එළිදක්වන ලද "කෙළිපද සරණිය" පොත් 1000 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට 2019 වර්ෂයේදී ගෙවීම් කිරීම. | 1,050,000 | i. නිවැරදි පොත් ප්‍රමාණය ගබඩාවට ලැබුණු බවට සනාථ කෙරෙන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.<br>ii. තොග පොත් නිසි පරිදි පවත්වා නොතිබුණි. | මෙම ප්‍රකාශනයේ පිටපත් 1000 ක් ලැබී ඇති අතර ජනාධිපති ක්‍රීඩා සම්මාන උළෙලේ බෙදාහැරීම් වලින් පසුව දැනට පිටපත් 155 ක් ඉතිරිව පවතී. මේ සම්බන්ධයෙන් තොග පොත් සටහන් කිරීමට කටයුතු යොදා ඇත. | පොත් ගබඩාවට ලැබිමේදී තොග ලේඛනයේ ඇතුලත් කළ යුතු අතර ලැබීම් තහවුරු කර ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02කට වඩා කාලය ඉක්මවූ රු.80,000 ක් වූ ආරක්ෂිත තැන්පතු කල් ඉකුත් වූ තැන්පතු ලෙස හඳුනාගෙන රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේ ක්‍රීඩාපිටි වෙන් කිරීම වෙනුවෙන් රඳවා ගත් මුදල් ආරක්ෂිත තැන්පතු ලෙස ඇතුලත් කර ඇති අතර එම මුදල ඉල්ලුවිට නැවත ලබාදිය යුතු බැවින් ආදායමට නොගෙන තැන්පතු ගිණුමේ පවත්වාගෙන යනු ලැබේ. | ආරක්ෂිත තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ අරමුදලේ අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි | ජාතික ක්‍රීඩා අරමුදල වෙනුවෙන් 2019 වර්ෂයේ සිට ක්‍රියාකාරි සැලැස්මක් සකස් කරනු ලැබේ. | අරමුදලේ පරිපාලන කටයුතු විධිමත්ව කරගෙන යාම සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් නියමිත කාලවකවානු තුළ පිළියෙල කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,495,404 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.26,110,110 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.19,614,706 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මූල්‍ය ආදායම් රු.16,381,654 කින් වැඩිවීම හා මූල්‍ය වියදම් රු.3,233,052 කින් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව ක්‍රීඩා සමාජ ගොඩනැගිල්ල හා ක්‍රීඩාපිටිය අළුත්වැඩියාව හා වැඩිදියුණු කිරීම් සඳහා අරමුදලින් රු.2,500,000 ක් ගෙවා තිබුණු ද, එම ක්‍රීඩා සමාජය තෝරා ගැනිම හා ක්‍රීඩා සමාජයේ අවශ්‍යතාවයන් හඳුනාගත් ආකාරය පිළිබඳ පැහැදිලි නොකෙරුණි. ඊට අමතරව එමගින් ක්‍රීඩා ක්ෂේත්‍රයට වූ දායකත්වය සහ කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය හා පසුවිපරම් කිරීම සිදුකර නොතිබුණු අතර, අරමුදල විසින් | ඌව ක්‍රීඩා සමාජයේ ප්‍රධාන වැඩිදියුණු කිරීම් සඳහා වැයවෙන මුළු පිරිවැයෙන් කොටසක දායකත්වයක් පමණක් ලෙස රු.මිලියන 2.5 ක් වැයකර ඇති අතර සම්පූර්ණ මුදල ලබාදී නොමැති බැවින් ප්‍රායෝගිකව පසුවිපරම් කිරීමට සාර්ථක ක්‍රමවේදයක් නොමැත. ඉදිරියේදී විධිමත් පසුවිපරම් ක්‍රමවේදයක් වඩාත් | ක්‍රීඩා අරමුදල මගින් ක්‍රීඩාපිටි සංවර්ධන කටයුතු සඳහා මුදල් ලබාදිමේදී ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සහ පසුවිපරම් කටයුතු සිදුකළ යුතු වීම. |

මෙවැනි ගෙවීම් සම්බන්ධයෙන් ක්‍රමවේදයක් මැනවින් ක්‍රියාවේ යෙදවීමට සටහන් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර කර ගතිමි.
නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ ආදායම රු. මිලියන 78 ක් හා වියදම රු.මිලියන 84 ක් වූ අතර අරමුදල සතුව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති වත්කම්වල එකතුව රු.මිලියන 129 ක් විය. මෙම අරමුදලේ ගනුදෙනු අභ්‍යන්තර විගණනයට භාජනය වී නොතිබුණි. | අභ්‍යන්තර විගණන ක්‍රමවේදයක් මනාව කළමනකරණය කිරීමට නිලධාරීන් යොමු කරවීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතු වීම. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැය ගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර වියදම් විෂයයන් 19 කට අදාළව සියයට 12 ක සිට සියයට 1200 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | පසුගිය වර්ෂයේ දරන ලද වියදම් හා ඉදිරි වර්ෂයට අපේක්ෂිත වියදම් පදනම්ව අයවැය පිළියෙල කිරීම් සිදුකර ඇති අතර, හැකි සෑම අවස්ථාවකදීම සාධාරණ පුරෝකථන අනුගමනය කර අයවැය පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබුවද ක්‍රීඩකයන් පදක්කම් ලබා ගැනීම් වැනි අසම්භාව්‍ය හේතු මත කරන ගෙවීම් සඳහා පුරෝකථනය කිරීම දුෂ්කර වේ. | අයවැය ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර පාලන කාරකයන් ලෙස යොදා ගත යුතු අතර විචලනයන් පිළිබඳව කාලීනව සැලකිල්ලට ගත යුතු වීම. |